

# පුංචි පවුල රත්තරං ද?

**වත්මන් ලොව ජනගහන වර්ධනය එක් අතකට ලොවට හිසරදයකි. "පුංචි පවුල රත්තරං" යන කියමන අප අතරට පැමිණියේ ද වැඩිවන ජනගහනය පාලනය උදෙසා පිළියම් සොයනු වස් ය. පුංචි පවුල් ක්‍රමය යටතේ පවුලක දරුවන් සංඛ්‍යාව බොහෝ දුරට දෙදෙනෙකුට සීමා විය. වත්මන් ලොව පවතින විවිධ ප්‍රශ්න හමුවේ දරුවන් ලැබීම දිනෙන් දිනම ක්‍රමයෙන් අඩු වීමක් මිස වැඩි වීමක් අපේක්ෂා කළ නොහැකි ය. එහි අරුත, ඉදිරියේ දී ජනගහණය පමණට වඩා අධික වීම වෙනුවට පමණට වඩා අඩුවීමේ අනතුරුදායක අනපේක්ෂිත ඛේදවාචකයකට ලොව මුහුණපාන බව ද එහි අතුරු ප්‍රතිඵලයන්ට ලොව බහුතරයක් රටවල් කෙසේ මුහුණ දෙනු ඇත් ද ? ප්‍රජා විද්‍යාඥයන් මේ ගැටලුවට කෙසේ විසඳුම් ලබා දෙයි ද?**

ලොව ජනගහණය පමණට වඩා අධික බව, අමුතුවෙන් පෙන්වා දිය යුතු නොවේ. ලාහෝරයේ සිටියත්, ලොස්ඇන්ජලීස් හි සිටියත්, ෂැංග්හායි හෝ සාවෝ පොලෝ හි සිටියත්, දිනපතා අපේ ජීවිත ගලා යන්නේ එකම රටාවකට ය.

ගරයට පැමිණීමේ දී වාහන තදබදයට අපි මුහුණ දෙන්නෙමු. පරිසර විනාශය අපි විඳ දරා ගනිමු.

සැමදු අපට ලැබෙන ප්‍රවෘත්තිවලින් කියැවෙනුයේ තුන්වැනි ලෝකයේ රටවල දුර්භික්ෂ, දිළිඳුබව, වසංගත, යුද්ධය, රැකියා සඳහා වූ තරඟකාරීත්වය සහ ශීඝ්‍රයෙන් හිඟවන ස්වාභාවික සම්පත් පිළිබඳ ය.

තත්ත්වය මෙසේ පවතිද් දී , පසුගිය ද එක්සත් ජාතීන් ගේ සංවිධානය අනතුරු හැඟවූයේ, ලොව බොහෝ නගරයන් හි ජනගහණය, බලාපොරොත්තු රහිත ලෙස අධික වන බවට ය.

එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල , ඒ සමග ම වාර්තාවක් නිකුත් කරමින් කියා සිටියේ, කිසියම් ක්‍රමානුකූල පියවරක් නොගතහොත්, ලොව දිළිඳුතම රටවල් පනහේ ජනගහණය 2050 වන විට තෙගුණයක් වැඩිවිය හැකි බව ය. එනම්, ජනගහණය බිලියන 1.7 ක් වාර්තා වීම ය.

එහෙත්, මෙය ලෝක ජනගහණය හා සම්බන්ධ එක් පැත්තක් පමණි. අනෙක් අතට සැලකීමේ දී සත්‍ය තත්ත්වය නම්, ලොව පුරා ජනතාව ඉතා ම අඩු දරුවන් සංඛ්‍යාවක් ලබමින් සිටින බව ය. මෙහි දී සාරතා අගය (Fertility rate) 1972 සිට අඩකින් පහළ වැටී ඇත. එනම් , එක් කාන්තාවකට, දරුවන් 6 සිට 2.9 දක්වා අගයක පහළ වැටීමකි. ප්‍රජා විද්‍යාඥයන් විසින් පවසන අන්දමට, කිසිදු නොවූ විරූ අයුරු එය තවදුරටත් පහළ වැටෙමින් පවතී.

කෙසේ වුවත්, ලොව වත්මන් ජනගහණය වූ බිලියන 6.4 , 2050 වන විට බිලියන 9 පමණ දක්වා වර්ධනය වීම තවදුරටත් නොනවත්වා සිදු වනු ඇත. එය තියුණු පිරිහීමකට ලක්වනුයේ ඉන් පසුව ය. රටවල් ගනණාවක් ම දැනටමත්, ජනගහණය අවරට යාමේ සලකුණු පහළ කොට ඇත.මෙය නව ප්‍රජා විද්‍යාත්මක යුගයක ඇරඹුම ද?


ලොව ජාතීන් ගේ ප්‍රමාණය, බලය, ආර්ථික වර්ධනය, ජීවිතවල තත්ත්වය ඇතුළු අපේ ලෝකය පිළිබඳ සැමෙකක් ම එමගින් වෙනස් කෙරෙනු ඇත. මේ විප්ලවීය වෙනසේ මූලිකත්වය උසුලනු ඇත්තේ, බහුතරයක්, සංවර්ධණය වෙමින් පවතින ජාතීන් ය.

# ජනගහණ වියවුල

**නුදුරු අනාගතයේ දී නගරවල ජනගහණය අධික වනු ඇත. එම වැඩිවීම උපත් අගය පහත හෙළීමට හේතු වනු ඇත.**


## විශාල නගර

**ග්‍රාමීය ජීවිත නාගරීකරණය වූ විට නාගරික ජීවන රටාවේ අදහස අඩුවෙන් දරුවන් ලැබීම ය.**




## අඩු දරුවන්

**දිළිඳු රටවල උපත් අගය පොහොසත් රටවල ප්‍රතිබිම්බයක් බවට පත් වනු ඇත.**




යුරෝපීය රටවල, වසර ගණනාවකට පෙර සිට උපත් අගය (Birth rate) පහළ වැටෙමින් පැවති බව නොරහසකි. මේ තත්ත්වය නැවත ගොඩ නැඟීමට නම් කාන්තාවක ලැබිය යුතු දරුවන් සංඛ්‍යාවේ අවම අගය 2.1 ක් විය යුතු ය. 2002 එක්සත් ජාතීන්ගේ ජනගහණ වාර්තාවට අනුව, යුරෝපයේ සාරතා අගය පවතින්නේ ඉහත අගයට වඩා ඉතා අඩුවෙනි.




යුරෝපයේ, සාරතා අගය සටහන් වගුවේ ඉහළින්ම සිටින ප්‍රංශය හා අයර්ලන්තයේ එම අගය 1.8 කි. ඉතාලියට හා ස්පාඤ්ඤයට එම වගුවේ පහළම ස්ථාන හිමිවන්නේ 1.2 ක අඩුම අගයක් වාර්තා කරමිනි. මේ අතරමැද වූ ජර්මනිය වැනි රටවල සාරතා අගය 1.4 කි. එය සත්‍ය වශයෙන් ම යුරෝපීය රටවල සාමාන්‍ය අගය යි. එහි අදහස කුමක් ද? එක්සත් ජාතීන්ගේ දත්ත නිවැරදි නම්, මීළඟ වසර 40 ක කාලය පුරා ජර්මනියේ වූ මිලියන 82.5 ක් වූ ජනගහණයෙන් මිලියන 5 ක් පමණ අඩු වනු ඇත. මුළු මහාද්වීපය පුරා ම මේ තත්ත්වය පවතිනු ඇති අතර, බල්ගේරියාවේ, සියයට 38 කින් ද රුමේනියාවේ සියයට 27 කින් ද එස්ටෝනියාවේ සියයට 25 කින් ද ජනගහණය අඩුවනු ඇත. දැනටමත් ජන ඝනත්වය අඩු නැගෙනහිර යුරෝපයේ ඇතැම් කොටස්, මුළුමනින්ම ජන ශූන්‍ය වනු ඇත.

රුසියාවේ ද වාර්ෂිකව 750,000 කට ආසන්න ජනකායක් දැනටමත් අඩුවෙමින් පවතී. එය " ජාතික අර්බුදයක්" ලෙස රුසියානු ජනාධිපති ව්ලැඩිමිර් පුටින් සඳහන් කරයි. බටහිර යුරෝපයේ එම අගය මේ සියවසේ මැද භාගය වන විට වසරකට මිලියන තුන දක්වා හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් ඉහළ නගිනු ඇත.

පුදුමය නම්, ඌන සංවර්ධිත රටවල් ද මෙම මාර්ගයට කොපමණ ආසන්නයෙන් ගමන් කර තිබේද යන්න ය. ආසියාව ගත් කළ, තවම නොවූවත්, ඉතාම ඉක්මනින්, ජපානය ජනගහණ හිඟයකට මුහුණපාන බව හොඳින් පෙනී යන කරුණකි.

# ශීඝ්‍ර ජනගහණ වර්ධනය - දුබලව අවසන් වේ

**දැනටමත් සිදුවනවාක් මෙන්, මේ සියවසේ මැද භාගයට ළඟා වීමට පෙර, ලොව බොහෝ ස්ථානවල උපත් අගය, එක් කාන්තාවකට ළමයින් 2 ක සංඛ්‍යාවකට වඩා පහළ වැටෙනු ඇත.**




( උපුටා ගැනීම : එ.ජා.ජනගහණ අංශය )

එක්සත් ජාතීන්ගේ දත්තයන්ට අනුව එරට කාන්තාවකගේ සාරතා අගය 1.3 ක පවතිමින්, අද මිලියන 127 ක් වූ ජනගහණය ඉදිරි දශක හතරක කාලය තුළ දී ඉන් 1 /4 ක් වනු ඇත.

එක්සත් ජාතීන්ගේ වාර්තා අනුව චීනයේ සාරතා අගය 1970 දී 5.8 ක් ව තිබූ අතර අද 1.8 කි. එහෙත් චීනයේ සංගණන වාර්තා එම අගය තව දුරටත් පහත හෙළන්නේ 1.3 ලෙස සටහන් කරමිනි. ඉහළ යන ජීවන අන්තරය හා සම්බන්ධව බැලූ කල එහි අදහස, යුරෝපයේ, වසර සියයකට අධික කාලයක් පුරා සිදු වනවාක් මෙන්, චීනයේ ජනගහණය ද එකම පරපුරක් ලෙස වයසට යැම ඉතා ඉක්මනින් සිදුවනු ඇති බව ය.

වර්ෂ 2019 ඇරඹීමත් සමග චීනයේ ජනගහණය හිණිපෙත්තටම නගිනු ඇත්තේ බිලියන 1.5 ක් වාර්තා කරමිනි. පසුව එය පල්ලම් බැසීම ඇරඹෙනු ඇත. සියවසේ මැදට පැමිණෙන විට චීනයේ සෑම පරපුරක ම ජනගහණය සියයට 20 – 30 අතර ප්‍රමාණයකින් පහළ බැසීම සිදු වේ. උපත් අගය අඩුවන ආසියාවේ කොතැනකත් මේ තත්ත්වය මෙසේ වනු ඇත. දැඩි උපත්පාලන වැඩ සටහන් අවම චීනය පවා උපත් අගය පහළ වැටීමේ ගැටලුවට මුහුණපානු ඇත.

වාණිජකරණයට ලක් වූ ජාතීන් සිටින සිංගප්පූරුව, හොංකොං, තායිවානය සහ දකුණු කොරියාව වැනි සියලූම රටවලින් වාර්තා වන්නේ සාරතා අගයෙහි උප වෙනස්වීමක් බව වොෂිංටනයේ ඇමරිකා එන්ටප්‍රයිසස් ආයතනයේ ප්‍රජා විද්‍යාඥයකු වන නිකොලස් එබර්ස්ටැඩ්ට් පවසයි. මේ ලැයිස්තුවට තායිලන්තය, බුරුමය, ඕස්ට්‍රේලියාව, ශ්‍රී ලංකාව , කියුබාව, කැරිබියානු ජාතීන් ද උරුගුවේ සහ බ්‍රසීලය ද අයත් වේ.

මෙක්සිකොවේ ජනගහණය ද දශක ගණනාවක් තිස්සේ ශීඝ්‍රයෙන් වයස්ගත වීම සිදු වේ. එය තවදුරටත් නොනවත්වා සිදුවන අතර ම එක්සත් ජනපදයට වඩා වයස්ගත ජනගහණයකට ද හිමිකම් කියනු ඇත.

මෙහි දී, ප්‍රශ්නයෙන් පැහැදිලිවම බැහැර කළ හැකි රටවල් ද වේ. යුරෝපයේ , ඇල්බේනියාවේ සහ කොසෝවෝ හි බැහැරින් වූ ප්‍රදේශ, ආසියාවේ හුදකලා පෙදෙසක් වූ මොංගෝලියාව, පාකිස්ථානය හා පිලිපීනය වීර්යයෙන් යුතුව, දරුවන් උත්පාදනය කිරීමේ කාර්යයෙහි නියැලී සිටී.

එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘතිය අනුව, ඉදිරි වසර 20 ක කාලය තුළ දී මැද පෙරදිග ජනගහණය දෙගුණ වනු ඇත. එනම් අද මිලියන 326 සිට 2050 දී මිලියන 649 දක්වා ය. ලොව ඉහළම සාරතා අගයක් වාර්තා කරන රටවල් අතර සෞදි අරාබිය ඉදිරියෙන් සිටී. එය 5.7 කි. එහෙත් පලස්තීන කලාපයේ එය 5.9 ක් ලෙස ද වාර්තා වේ. යේමනයේ එය 7.2 කි. මෙය පුදුමය උපදවන තත්ත්වයකි. ටියුනීසියාව, එක් කාන්තාවකට දරුවන් දෙදෙනකු ලෙස වූ වෙනස්වීමේ අගයට වඩා පහළින් සිටින අතර, ලෙබනනය හා ඉරානය එහි එළිපත්තෙහි සිටී.

සමස්තයක් වශයෙන් ගත් කළ ජනගහණ වර්ධනය වැඩිවීම සිදු වන්නේ ළදරු මරණ අනුපාතය අඩුවීම නිසා ය. එහෙත් , සාරතා අගය සංවර්ධිත රටවලට වඩා වේගයෙන් පහළ වැටීම මගින් සටහන් කෙරෙන්නේ, ඉදිරි දශක කිහිපය පුරා ලොව සෙසු ජාතීන්ට වඩා වේගයෙන්, මැද පෙරදිග ජනගහණය වයස්ගත වන බව ය.

අප්‍රිකාවේ උපත් අගය, ඉහළ මට්ටමක පවතී. ඒඩ්ස් වසංගතය පවතිද්දීත්, එහි ජනගහණය ඉහළ නගින බව පෙන්නුම් කෙරේ.

එක්සත් ජාතීන් ගේ සංවිධානය වාර්තා කරන අන්දමට, අද ලොව පුරා සෑම තැනම සිටින මිනිසුන් ගම අතහැර නගරයට සංක්‍රමණය වන බව පෙනී යයි. 2007 වන විට ලොව ජනගහණයෙන් අඩකට වඩා නිවහන ලෙස තෝරාගනු ඇත්තේ නගරය යි.




> **වත්මන් ලෝකයේ, දරුවන් ලැබීම අධෛර්ය යට පත් කරණ ප්‍රධානම සාධකය වී ඇත්තේ ධනවත්කමයි. ඈත අතීතයේ යුරෝපයේ මෙන්, එය අද ආසියාවට ද පැමිණ තිබේ. සමාජ විද්‍යාඥ බෙන් වැටෙන්බර්ග් පවසන අන්දමට ධනපතිත්වය" යනු අද හොඳම පවුල් සැලසුම් ක්‍රමය යි.**

එහිදී දරුවකු ලැබීම සම්පතක් ලෙස සිතීම වෙනුවට එය වියදමක් බවට පත් වනු ඇත.

1970 සිට 2000 දක්වා නයිජීරියාවේ නාගරික ජනගහණය සියයට 14 සිට සියයට 44 දක්වා ඉහළ නැග්ගේ ය. දකුණු කොරියාවේ එය, සියයට 20 සිට සියයට 84 දක්වා විය. එපමණට ම ලාගෝස් සිට මෙක්සිකෝව දක්වා විශාල නගරවල ද එක් රැයකින් ජනගහණය ඉහළ නැගීමේ තත්ත්වයක් විය. මෙහි දී නගරවල ජනගහණය වැඩිවීම හා ප්‍රතිලෝමව උපත් අනුපාතිකය පහළ වැටීම සිදුවේ. මෙහිලා බලපාන වෙනත් සාධක ද වේ. කාන්තාවන්ගේ සාක්ෂරතා අගය ඉහළ යාම, දික්කසාදය, ගබ්සා කිරීම, ප්‍රමාද වී විවාහ වීමට ලොව පුරා ඇති ප්‍රවණතාව ඒ සඳහා උදහරණ වේ.

ඒ හැරුණු විට පසුගිය දශකය පුරා උපත් පාලන ක්‍රම භාවිතය ද ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. එක්සත් ජාතීන්ගේ දත්ත අනුව, විවාහපත් හෝ නීත්‍යානුකූලව විවාහ නොවූ, ප්‍රජනක වයසේ පසුවන කාන්තාවන් සියයට 67 ක් පමණ දැන් අස්වාභාවික උපත් පාලන ක්‍රම යොදා ගන්නා බව පෙන්වා දී ඇත. අද , ලොව HIV ආසාදිතයන් බහුල වෙමින් පවතින ඉන්දියාව වැනි රටවල, මේ තත්ත්වයට හේතුවී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම රෝග බිය යි.

මත්පැන්වලට ඇබ්බැහි වීම, දුර්වල මහජන සෞඛ්‍ය තත්ත්වය සහ කාර්මික දූෂණය, රුසියාව වැනි රටවල පිරිමින්ගේ ප්‍රජනක සාධකයන් විනාශ කිරීමට වරදකරුවන් වී තිබේ.

වත්මන් ලෝකයේ, දරුවන් ලැබීම අධෛර්ය යට පත් කරණ ප්‍රධානම සාධකය වී ඇත්තේ ධනවත්කමයි. ඈත අතීතයේ යුරෝපයේ මෙන්, එය අද ආසියාවට ද පැමිණ තිබේ. සමාජ විද්‍යාඥ බෙන් වැටෙන්බර්ග් පවසන අන්දමට "ධනපතිත්වය" යනු අද හොඳම පවුල් සැලසුම් ක්‍රමය යි.

පිලිප් ලෝන්ග්මන් මෑතකදී ප්‍රකාශයට පත් කළ "The Empty Cradle" (හිස් තොටිල්ල) ග්‍රන්ථයේ විස්තර කර ඇති ආකාරයට, ලෝක ආර්ථිකය සැලකිල්ලට ගන්න.

ලෝක සෞභාග්‍යයට, පහළ වැටෙන උපත් අනුපාතය අනතුරු හැඟවීම් කරන ආකාරය සහ ඒ සඳහා අප කුමක් කළ යුතුද?

ආර්ථික වර්ධනය සහ ජනගහණය සැම විටම ඉතා සමීපව එකිනෙකට ඇඳී තිබේ. 'ජනගහණ වර්ධනයක් නොමැතිව පැහැපත් ආර්ථිකයක් ඇතිවිය හැකි බව සිතීමට ආසක්ත වූවෝ ද වෙති. එහෙත් ආර්ථික විද්‍යාඥයන් යනු සර්ව අශුභවාදී හූ ය.' ලෝන්ග්මන් පවසයි.

'අනාගතයේ කුමක් සිදුවේ දැයි දැන ගැනීමට, මාත්‍රයක් ලෙස ඔබ බැලිය යුත්තේ ජපානය හෝ යුරෝපය දෙස පමණී ' ඔහු තවදුරටත් පවසා තිබේ.

ඉතාලි ජාතික ප්‍රජා විද්‍යාඥයන් අනාවැකි පළ කරන්නේ , වැඩ කරන වයසේ ජනගහනයෙන් සියයට 40 ක පහළ වැටීමක් ඉදිරි දශක හතරක කාලය පුරා සිදුවිය හැකි බව ය.

2020 වන විට යුරෝපයේ ළදරු උත්පාදකයන් විශ්‍රාම ගැනීම ඇරඹුව හොත් කුමක් සිදු වේද?

ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය, ඕස්ට්‍රියාව වැනි රටවල නවතම විශ්‍රාමික ප්‍රතිසංස්කරණ පිළිබඳ, නූතන ගැටුම් සහ පෙළපාලි, යුරෝපයේ වයස්ගත සහ තරුණ පරම්පරා අතර සමාජ විද්‍යාත්මක යුද්ධයක ඇරඹුම පිළිබඳ පෙරනිමිත්තක් පමණී. එහෙත් චීනයේ මතු වී එන විරෝධතා සමග සැසැඳීමේ දී එය මද සටනක් පමණී.

ඉදිරියේ දී චීනයේ ඇතිවිය හැකි පීඩාකාරී තත්ත්වයට ඔරොත්තු දෙන පරිදි එහි ආදායම වේගයෙන් වැඩි නොවනු ඇත. එහි ඇතැම් ගම්බද පෙදෙස්වල, බොහෝ තරුණ පිරිස් නගරවලට නිදහසේ පැමිණීමට පුරුදු වනු ඇත්තේ, වැඩිහිටියන් රැකබලා ගැනීමට කිසිවකු නොමැති වන පරිදි ය.

වයස්ගතවන ජනගහණය නිසා, චීනයේ අඩුම්ල කම්කරු බලකාය කඩා වැටීම සිදුවනු ඇත. ආර්ථික විද්‍යාඥ 'හියු ඇන්ගැන්ග්' පවසන්නේ 2015 න් පසු, එකී කම්කරු සංචිතය සිඳීයාම ඇරඹෙනු ඇති බව ය.


එහෙත්, මෙහිදී බටහිරාණුකරණ විසඳුමකට අනුවර්තණය වීමට, චීනයට කුඩා අවස්ථාවක් තිබේ. එනම්, එහි ශ්‍රම බලකායේ අධ්‍යාපනික මට්ටම ඉහළ නංවා එය වඩාත් ඵලදායී කිරීම ය. එය කළ හැකි වේවි ද? මෙය විවෘත ප්‍රශ්නයකි.

ආසියාවේ මතුව එන ආර්ථික බලතල සාර්ථකත්වයට පත්වීමට පෙර, ප්‍රථමයෙන් ජනගහණය වයස්ගතවීම සිදුවනු ඇත්තේ චීනයේ ය. ජපානය ද ඒ තත්ත්වයට පත්වන ලකුණු පැහැදිලිව පෙනෙන්නට පටන් ගෙන තිබේ. මෑතකදී සීඝ්‍රයෙන් අලෙවි වූ 'The Economy Of Shrinking Population' ග්‍රන්ථයේ කර්තෘ , ආර්ථික විද්‍යාඥ, 'අකිහිකෝ මැට්සුටානි' අනාවැකි පළ කරන්නේ 2009 වන විට ජපන් ආර්ථිකය 'ඍණ වර්ධක'යුගයකට පිවිසෙන බව ය. 2030 වන විට එහි ජාතික ආදායම සියයට 15 කින් අඩු වනු ඇත. 'ජීවිතය අඩු පහසුකම් සහිත තත්ත්වයකට පත්වනු ඇත' මැට්සුටානි , තව දුරටත් පවසා සිටී. කැපී පෙනෙන පවිත්‍රතාවෙන් යුත් ටෝකියෝ නගරය, 1970 ගණන්වල නිව්යෝර්ක් නගරයට බොහෝ සෙයින් සමාන පෙනුමක් උසුලනු ඇත. ඒ, බොහෝ නාගරික පදිංචිකරුවන්, උප නාගරික ප්‍රදේශවලට හදිසියේ සංක්‍රමණය වීමත් සමග ය. නාගරික බදු මුදල් අඩුවීම නිසා නගරවල පවිත්‍රතාව හොඳින් රැකගැනීමට පාලකයන් අසමත් වනු ඇත. ජපනුන්ට මේ සඳහා සාර්ථකව මුහුණ දිය හැකි ද? 'ඔවුන්ට මුහුණ දීමට සිදුවේ' වෙනත් විකල්පයක් නැත.මැට්සුටානි සඳහන් කර තිබේ.

අනාගත ලෝකයේ, ඇතැම් විට, ලොව ධනවත් බව අතර ඇති පරතරය වර්ධනය වන මුත්, දිළිඳු රටවලට එමගින් අවස්ථා උදා වනු ඇත. ජනගහණය අධික, සම්පත් අඩු දකුණේ සිට, දිගින් දිගට රැකියා බහුල විය හැකි ජනගහණය අඩු උතුර දක්වා ශ්‍රමය ගලා යනු ඇත. පොහොසත් ජාතීන්ගෙන් ලැබෙන මූල්‍ය ධනය සහ වෙනත් වත්කම් හෝ මුදල් ආදායම් ඊට ප්‍රතිවිරුද්ධ දෙසට ගලා යනු ඇත. සැමට යහපත සලසමින් එය එසේ සිදුවිය හැකි ද?

උතුරු අප්‍රිකාවෙන්, යුරෝපයට සිදුවන මහා පරිමාණ ආගමන වෙනුවෙන් වූ විරෝධතා, ජපානයේ ශූන්‍ය ආගමන ප්‍රතිපත්තිය වැනි දෑ දිගින් දිගටම පවත්වාගෙන යෑම අපහසු වනු ඇත. ආකල්ප වෙනස් වෙමින් පවතී. දශකයකට පමණ පෙර යුරෝපීයයෝ ද ශූන්‍ය ආගමන ප්‍රතිපත්ති පිළිබඳ කතා කළහ.

**අනාගත ලෝකයේ, ඇතැම් විට, ලොව ධනවත් බව අතර ඇති පරතරය වර්ධනය වන මුත්, දිළිඳු රටවලට එමගින් අවස්ථා උදා වනු ඇත. ජනගහණය අධික, සම්පත් අඩු දකුණේ සිට, දිගින් දිගට රැකියා බහුල විය හැකි ජනගහණය අඩු උතුර දක්වා ශ්‍රමය ගලා යනු ඇත. පොහොසත් ජාතීන්ගෙන් ලැබෙන මූල්‍ය ධනය සහ වෙනත් වත්කම් හෝ මුදල් ආදායම් ඊට ප්‍රතිවිරුද්ධ දෙසට ගලා යනු ඇත. සැමට යහපත සලසමින් එය එසේ සිදුවිය හැකි ද?**



එහෙත් දැන් දැන් ඒ සඳහා ඔවුහු සූදනම් වෙමින් සිටිති. එහෙත් අවශ්‍ය පරිමාණයෙන් එය සිදු කරගත හැකි වේ ද?

ඉදිරියේ දී ඇතිවිය හැකි තත්ත්වය ප්‍රබල විය හැකි ය. එක් අතකින්, තම අවහිර වූ ජාතික අනන්‍යතාව රැක ගැනීමට අදහස් කරන ජනතාව හා අනෙක් අතට, ජනගහණය අධික වීම හා තම රටවල රැකියා අවස්ථා අඩු වීමෙන් ගැලවීමට මං පෙත් සොයන ආගමන කණ්ඩායම් අතර, පවතින ආතතිය තදබල වීම ඉදිරියට සිදුවිය හැකි ය.

පිලිපීනය වැනි රටවල අධ්‍යාපනය ලැබූ ශ්‍රම බලකාය, ළමයින් බලා ගැනීම, ගෙවතු කම්කරු සේවය වැනි පහත් මට්ටමේ රැකියාවලට පවා එකග වනු ඇත්තේ, එමගින් ලෝක වෘත්තික ඉණිමගෙහි ඉහළට යාමට ය. මෙය, ඇතිවන ප්‍රශ්නයට යම්තාක් දුරකට විසඳුමකි.

මැද පෙරදිග හා උතුරු අප්‍රිකාවේ ජනගහණයෙන් බහුතරයක් නියෝජනය වන මිලියන ගණනක් වූ අරාබි තරුණයන්ගෙන් අඩකට පමණ ම රැකියා විරහිත වීම බරපතල ප්‍රශ්ණයක් වනු ඇත. යුරෝපය සහ ආසියාවේ බහුතරය අඩුවෙද්දී ඇමරිකා එක්සත් ජනපදයේ ජනගහණය සාපේක්ෂව ස්ථිරව පවතිනු ඇත. වැඩි වැඩියෙන් සිදුවන ආගමනයන් සමග, ඇමරිකාව යනු වර්ධනය ඉදිරියටම පවත්වා ගෙන යන එකම නූතන ජාතිය වනු ඇත. ඉදිරි වසර 45 පුරා ඇමරිකාව, මිලියන සියයක් ජනතාව වැඩිකර ගන්නා අතර, යුරෝපයේ දළ වශයෙන් එකී ප්‍රමාණයක් අඩුවන බව සමාජ විද්‍යාඥ වැටෙන්බර්ග් සඳහන් කර තිබේ.

ඉදිරියේ දී පැමිණෙන ජනගහණය අවම වීමේ ප්‍රහාරයෙන් ඇමරිකාව ගැලවෙන බව මින් අදහස් නොකෙරේ. වයස්ගත වන ශ්‍රම බලකායේ ප්‍රශ්නයට හා එහි බර දැරීමේ වගකීමට, ඔවුන් ද මුහුණ පානු ඇත.ඇමරිකාවේ ප්‍රධාන වෙළඳ සහකරුවන් වන, යුරෝපයේ හා ජපානයේ ප්‍රශ්න, ඉතාමත් ඉක්මනින් ඔවුන්ගේ ද ප්‍රශ්න වනු ඇත. මෙහිදී වොෂිංටනය කණගාටු වන්නේ ත්‍රස්තවාදය සහ පවත්නා තත්ත්වය බිඳ වැටීම පිළිබඳ ය.

වත්මන් ලොව පවතින ව්‍යාකූලභාවය සහ බිඳ වැටීම් මගින් පෙන්වා දෙන්නේ, ඉදිරියේ දී ඇතිවිය හැකි භයානක තත්ත්වය පිළිබඳ කුඩා ඉඟියක් පමණි.

ඇමරිකාවට සිටින්නේ යුදමය වශයෙන් කරට කර සිටිය හැකි තරග කරුවන් කිහිප දෙනෙකු වුවත්, අධිතාක්ෂණික යුධෝපකරණ, ලේසර් මගින් යොමු කළ හැකි මිසයිල හා රේඩාර්වලට හසු නොවන බෝම්බ හෙළන යානා නිපදවීමේ ව්‍යාපෘති ආදිය සඳහා වැය වන මුදල ක්‍රම ක්‍රමයෙන්, එරට ට දරාගත නොහැකි තත්ත්වයට පත් වෙමින් ඇත.

එලෙසම සමාජයීය අවශ්‍යතාවන් ඉහළ යව තත්ත්වයක් මත, ආර්ථික සංවර්ධන වේගයේ අඩාලවීමක් පැහැදිලිව දැකිය හැකි ය. ත්‍රස්තවාදයට එරෙහිව කෙරෙන යුද්ධය පරම්පරා ගණනක් පවතින එකක් වුවහොත්, ඇමරිකාවට එයට වියදම් දැරීමට හැකියාවක් නොමැති බව, ඇමරිකානු ජාතික ආරක්ෂක උපදේශක කොන්ඩොලීසා රයිස් පවසා සිටී.

ඉදිරියේ දී ඇතිවිය හැකි තත්ත්වය හොඳින් අවබෝධ කර ගත් රජයන්ට පමණක්, ඒවා මැඩපැවැත්වීම සඳහා පියවර ගත හැකි වේ. ඒ අනුව ප්‍රංශය හා නෙදර්ලන්තය දැනටමත් පවුල් සහයෝගිතා ප්‍රතිපත්ති විමධ්‍යගත කර, එමගින්, කාන්තාවන්ට මාතෘත්ව අවශ්‍යතා සහ ළමයින් වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන බඳු අඩු කිරීම් ලබා දීමට පියවර ගෙන ඇත. ස්කැන්ඩිනේවියානු රටවල් දෙමාපියන්ට ලබා දෙන වැටුප් සහිත නිවාඩු, සෞඛ්‍ය පහසුකම් හා කෙටි කාලීන රැකියා ලබා දීම වැනි දිරිමත් කිරීම් මගින් උපත් අගය වැඩිකර ගැනීමට කටයුතු යොදා ඇත. සිංගප්පූරුව ද මෙවැනිම ප්‍රතිපත්ති අනුගමනය කරමින් සිටී.

දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු ඇතිවූ උපත් අගය වැඩිවීමේ උච්චතම අවස්ථාව් දී, ප්‍රජා විද්‍යාඥයෝ, ඉදිරියේ දී ඇති විය හැකි, ශීඝ්‍ර ජනගහණ වර්ධන වේගය පහළ බැසීම හා සාරතාව අඩුවීම පිළිබඳ අනාවැකි පළ කළහ.

පාරිසරික වශයෙන් සැලකීමේ දී ජනගහණය අඩු ලොව වඩාත් හොඳ වීම සත්‍යයකි. වැනසී ගිය පරිසරය නැවත ඇති වී පිරිසිදු වාතයෙන් ද, පරිපූර්ණ ලොව වඩාත් හොඳ එකක් වන බව නිසැක ය. එවැනි ලොවක මිනිසුන් දීර්ඝ කාලයක් ජීවත් වීමත්, මනා සෞඛ්‍යසම්පන්නව පසු වීමත් , අඩුම තරමින් සංවර්ධනය වූ රටවල් තුළවත් සිදු වේ. එවන් පරිසරයක ජීවත් වන්නන්ට විශ්‍රාම ගැනීමට පෙර, වඩාත් දිගු කාලයක් වැඩ කිරීමට හැකි මෙන් ම ඇතැම්විට එය අනිවාර්ය ද විය හැකි ය.

ආර්ථික විද්‍යාඥ මැට්සුටානි පවසන අන්දමට ජනගහණය වර්ධනය අඩාල වීමත් සමඟ ජාතික ආදයම් අඩු වුවත්, ඒක පුද්ගල ආදායම අනිවාර්යයෙන්ම එසේ නොවිය හැකි ය. මේ තත්ත්වය යටතේ එක් දෙයක් ස්ථිර ය.

එනම් නිවාස ඉඩකඩම් මිල පහත බැසීම ය. එමගින් අවාසිදායක වන්නේ ඉඩකඩම් හිමි වැඩිහිටියන්ට ය. එහෙත් එය තරුණ පරපුරේ අනාගතයට වාසිදායක වනු ඇත. මේ පිළිබඳ හරි හැටි යමක් කාට කිව හැකි ද? ඇතැම් විට අලුතින් එකතු වූ ඉඩකඩ සහ ලාබදායි දිවි පෙවෙත වැඩි වැඩියෙන් දරුවන් ලැබීමට ඔවුනට අනුබල දෙනු ඇත. ඒ අනුව මිනිසාගේ ජීවන චක්‍රය එහි සමබරතාව රැකගනු ඇත. ❑

**ලලනි මායාදුන්න**
**නිව්ස්වීක් ඇසුරෙනි**

